කටුවන ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කටුවන ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කල මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් මිලදීගෙන තිබූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ලී බඩු හා සවිකිරීම් රු.243,773 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අඩුවෙන් ගිණුම්ගතකර තිබූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ලී බඩු හා සවිකිරීම් වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දී අලුත්වැඩියා හා නඩත්තු වෙනුවෙන් දරන ලද රු.429,020 ක් වූ පුනරාවර්ථන වියදම් ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි.	වියදම් හඳුනාගෙන නිවැරදි ආකාරයට කටයුතු කරන බව.	ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.
(ඇ)	මීද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරන ලද මුදල රු.මිලියන 3.88 ක් මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවද වැඩිදියුණු කිරීම් කටයුතු අවසන් වූ වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	මෙම මුදල මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කල යුතුය.
(ඈ)	මුද්දර ගාස්තු ආදායම රු.මිලියන 1.53 ක් අඩුවෙන් හා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. මිලියන 3.98 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මුද්දර ගාස්තු ආදායම නිවැරදි අගයෙන් ගිණුම්ගත කල යුතුය.

(ඉ)	ජල ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබූ රු.613,960 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	වියදම් හඳුනාගෙන නිවැරදි ආකාරයට ගිණුම් තැබීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	පුස්තකාල පරිග්‍රහණ ලේඛනය අනුව පුස්තකාල පොත් ශේෂය රු.5,520,678 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.6,230,274 ක් ලෙස දැක්වීම නිසා ජංගම නොවන වත්කම් රු.709,596 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද පිරිවැය හා පරිග්‍රහණ ලේඛනය අනුව පිරිවැය වෙනස හඳුනාගෙන 2025 වර්ෂයේ ගිණුම් තුළ නිවැරදි කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.456,517 ක වෙනසක් පැවතුණි.	නිරීක්ෂණය පිළිගන්නා බව.	අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම හෝ උපලේඛනය නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු වටිනාකම රු.මිලියන 65.04 ක් වටිනා ගිණුම් විෂයයන් දෙකක් සම්බන්ධව විස්තරාත්මක උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක පරිදි පරීක්ෂා කිරීමට නොහැකිවිය.	ඉදිරියේදී ලේඛණයෙන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ජර්නල් ගැලපීමට අදාල විස්තරාත්මක උපලේඛනය විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මුදල් රෙගුලාසි 571	වසර 02 ක් ඉක්මවූ රු.මිලියන 1.75ක් වූ විවිධ තැන්පතු, කර්මාන්ත අත රුදවුම්, ආරක්ෂිත ඇප තැන්පත් හා ටෙන්ඩර් ඇප තැන්පත් ශේෂ 80 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ලිපි මගින් දැනුවත් කර ඉදිරියේදී ආදායමට ගැනීම සඳහා කටයුතු කරන බව	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වසර 02 ඉක්මවූ ඇප තැන්පත් සම්බන්ධයෙන් නියාදනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයේ 04 ඡේදය	කඩ කාමර බදුදුන් දිනයේදී හෝ මාස 06 ක් ඇතුළත උපරිම වාර 06 කට යටත්ව එක්වන් මුදල් අයකළ යුතු වුවත්, 2022 හා 2024 යන වර්ෂවල බදුදුන් කඩ කාමර 06 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.මිලියන 1.51ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සකස් කරමින් පවතින බව.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව එක්වන් මුදල් අයකර ගැනීමට හෝ ගිවිසුම් කඩකිරීම හේතුවෙන් දේපල නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 31.66 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 19.36 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	5,116,668	6,024,065	4,206,608	1,821,487	1,709,250	1,573,980	1,580,510	4,030
කුලී	17,847,000	18,838,338	18,811,742	1,956,584	17,865,200	14,760,888	14,931,798	1,929,988
බලපත්‍ර ගාස්තු	2,257,800	2,918,948	2,594,868	424,380	1,524,150	2,224,937	2,346,137	100,300
වෙනත් ආදායම්	44,106,280	46,577,413	48,113,824	13,959,605	37,304,780	43,882,269	41,702,007	15,496,017
එකතුව	**69,327,748**	**74,358,764**	**73,727,042**	**18,162,056**	**58,403,380**	**62,442,074**	**60,560,452**	**17,530,335**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු කඩ කාමර 41 කින් ලැබිය යුතු කඩ කුලී රු.815,273 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	රු.273,144 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ආ)	සභාව සතු වාහන කුලියට දීමෙන් ලැබිය යුතු කුලී රු.925,301 ක්, ටෙන්ඩර් දේපලකින් ලැබිය යුතු රු.90,750 ක් හා ජංගම මත්ස්‍ය අලෙවිසැලෙන් ලැබිය යුතු කුලී රු.55,559 ක් අයකර ගෙන නොතිබුණි.	වාහන කුලී රු.128,897 ක්, අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බවත් ටෙන්ඩර් දේපළ, කුලී අයකර ගැනීමට නඩු පවරා ඇති බව.	හිඟ මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.

(ඇ)	කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා කඩකාමර හා දෙවන මහල ගිමන්හලක් හා භෝජනාගාරක් පවත්වාගෙන යාමට 2017 ඔක්තෝබර් 23 දින සභාව සමඟ එළඹි ගිවිසුම අනුව 2014 වර්ෂයේ කඩකුලී තක්සේරු වටිනාකම අනුව රු.මිලියන 8.45 ක එක්වන් මුදල් ගෙවීමටත්, දේපල වැඩි දියුණු කිරීමට රු.මිලියන 16.64 ක් වැය කිරීමටත් එම වැයවන මුදල කුලී මුදලින් වසර 30 ක් තුල මාසික වාරිකය රු.462,211 ක් ලෙස හිලව් කිරීමටත් එකඟ වී තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විට එක්වන් මුදල් ගෙවීම හා දේපල වැඩිදියුණු කර ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි.	ව්‍යාපාරික කටයුතු සඳහා විවෘත කිරීමට පියවර ගන්නා ලෙසත් එසේ නොවන්නේ නම් ඉහත දේපල නැවත ප්‍රාදේශීය සභාවට ගැනිමට කටයුතු කරන බව දැනුම් දී ඇති බව.	චක්‍රලේඛ හා ගිවිසුම් ප්‍රකාරව එක්වන් මුදල් අයකර ගැනීමට හා දේපල වැඩිදියුණු කර ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට හෝ අදාල දේපල සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු මගින් අයකරගත යුතු ආදායම රු.461,080 ක් විය.	රු. 314,500 ක් අයකරගත් බවත් රු.88,800 ක් කපා හැරීම සඳහා ඉදිරිපත් කරන බව සහ හිඟ මුදල අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඉ)	ලැබිය යුතු ජල ගාස්තු රු.මිලියන 13.23 ක් අයකර ගෙන නොතිබූ අතර එම ශේෂය තුළ රු.10,000 හා රු.100,000 ඉක්මවූ පාරිභෝගිකයින් පිළිවෙලින් 199 ක් හා දෙදෙනෙක් වූයෙන් ආදායම් අයකිරීම සතුටුදායක මට්ටමක නොපැවතුණි.	රු.622,552 ක මුදලක් අයකර ගෙන ඇති බව ද රු.10,000 කට වැඩි හිඟ ජල ගාස්තු ඉක්මවූ පාරිභෝගිකයන් 59 දෙනෙකුගෙන් මේ වන විට සම්පූර්ණ මුදලම අය කරගෙන ඇති බව සහ ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.මිලියන 2.86 ක් හා රු.මිලියන 34.32 ක් අයවිය යුතුව තිබුණි.	ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.මිලියන 1.3 ක් හා රු.මිලියන 19.29 ක් ලැබී ඇති බව.	ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාර තුමා හා ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය සම්බන්ධීකරණය කර මේ සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණය අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභා බලප්‍රදේශයේ සිදුකර ඇති නිසි සංවර්ධන සැලැස්මක් නොමැති අනවසර ඉදිකිරීම් 09 ක් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 49 හා 52 වගන්තිවල සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම හෝ 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ 01 වන කොටසේ 02 වන උපලේඛනය ප්‍රකාරව එම ඉදිකිරීම්වලට අදාලව රු.578,364 ගාස්තු අයකර විධිමත් කිරීම් කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී එම සංවර්ධන සැලසුම් විධිමත්ව අනුමත කර දීමටත් ඒ සඳහා වන ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කරන බව.	යොමුගත ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගාස්තු අය කර විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එකතු වටිනාකම රු.මිලියන 12.56 ක් වූ අක්කර 18 පර්චස් 0.084 ක් වූ ඉඩම් 16 ක් හා වාහන 05 ක් සභාව විසින් පරිහරණය කලද එහි නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවරා ගැනීම සඳහා ලිපි යොමුකර ඇති බව.	සභාව විසින් පරිහරණය කරන වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාව සතු ප්‍රමාණය අක්කර 03 පර්චස් 33.19 ක් වූ ඉඩම් 03 ක් හා වටිනාකම රු.මිලියන 36.34 ක් වූ කිරම කඩකාමර සහිත බස් නැවතුම්පළ ගොඩනැගිල්ලේ ඉහල මහල වර්ෂ 05 ක කාලයක සිට බදු දීමට කටයුතු නොකිරීම නිසා එකී වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.	ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	වත්කම් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගෙන ආදායම් උත්පාදනය කර ගත යුතුය.
(ඇ)	හම්බන්තොට දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය විසින් කටුවන ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇති කිරම නගරයේ ඉදිකරන ලද වර්ග අඩි 2140 ක් පමණ වන සහ වටිනාකම රු.මිලියන 4.25 ක් වූ කඩකාමර සංකීර්ණයේ, ඉහල මහලෙහි ඉදිකිරීම් සිදු කර නොතිබීම නිසා අදාළ ගොඩනැගිල්ල විනාශයට ලක් වෙමින් පැවතුණි.	අදාල කටයුතු සිදු කිරීම සඳහා අරමුදල් නොමැති බව.	වත්කම් ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුය.

(ඇ)	සභාව සතු වාහනයක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හා ධාවනයෙන් ඉවත් කර තිබූ සභාව සතු වාහන 04 ක් අපහරණ කිරීමට කටයුතු කර නොතිබුණි.	අලුත්වැඩියාව සඳහා කටයුතු සිදු කරන බවත් වාහන 4 ඉදිරියේදී අපහරණ කටයුතු සිදු කරන බව.	භාවිතයට ගතහැකි වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු අතර, ධාවනයෙන් ඉවත්කර තිබූ සභාව සතු වාහන 04 අපහරණ කටයුතු කළ යුතුය.

3.3 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මඟින් ඇස්තමේන්තු කර තිබූ එකතු වටිනාකම රු.මිලියන 28.55 ක් වූ සංවර්ධන යෝජනා 04 ක් වර්ෂය තුළ දී ක්‍රියාත්මක කර නොතිබුණි.	එක් ව්‍යාපෘතියක් මේ වන විට නිම කර ඇති බව හා එක් ව්‍යාපෘතියක් ගිවිසුම්ගත වී වැඩ ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති 02 ක ඇස්තමේන්තු සකසමින් පවතින බව.	අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ තනතුරු 02 කට අදාළ අතිරික්තතා 23 ක් විධිමත් කරගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.	අවශ්‍ය කටයුතු සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලිපි යොමුකර ඇති බව.	සභාවේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් පිළිබඳ සමාලෝචනයක් කඩිනමින් සිදු කළ යුතුය.
(ආ)	2002 ජනවාරි සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වසර 22 කට අධික කාලයක් ජල සභායක තනතුර අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් කර ගැනිමට කටයුතු කිරීමෙන් තොරව නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවාගෙන වැටුප් වශයෙන් එකතුව රු. මිලියන 13.98 ක් ගෙවා තිබුණි.	තනතුර අනුමැතියට යවා ඇති බව.	කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සමාලෝචනය කර තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විධිමත් පරිදි ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම නිසා සභාව තුළ සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය අතුරින් නිලධාරීන් 10 දෙනෙකු වසර 05 සිට 10 දක්වා වූ කාලපරිච්ඡේදයක් එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවැතුණි.	දැනට වසර 05 ට වැඩි සියළු දෙනා ස්ථානමාරු ඉල්ලුම් කර ඇති බව.	යොමු ගත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 03 අනුව මිද්දෙනිය හෙල්ලල ගලගාවහේන නැමැති ඉඩමේ පිහිටි ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යස්ථානයේ පවතින ප්ලාස්ටික්, පොලිතින්, කඩදාසි, වීදුරු සහ යකඩ වෙන් වෙන් වශයෙන් තෝරා ඒවා ප්‍රතිචක්‍රීකරණය සඳහා අදාළ ආයතන වෙත යොමුකළ යුතු අතර, එසේ යොමු කරනු ලබන තෙක් සුදුසු ස්ථානයක සුළඟට ගසාගෙන නොයන ලෙස හා වර්ෂා ජලයට නිරාවරණය නොවන සේ විධිමත්ව ගබඩා කර තැබිය යුතු වුවත්, සභාව එපරිදි කටයුතු කර නොතිබුණි.	කසල වෙන්කර විධිමත් ලෙස ගබඩා කොට ප්‍රතිචක්‍රීකරණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	බලපත්‍රයේ කොන්දේසි අංක 03 අනුව ඝන අපද්‍රව්‍ය තෝරා ඒවා විධිමත්ව ගබඩාකර තැබීම හා ප්‍රතිචක්‍රීකරණය සඳහා අදාළ ආයතන වෙත යොමුකළ යුතුය.